**සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම - 2023**
**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ 10.1 වගන්තිය හා xii වන පරිච්ඡේදයේ 7.2 හා 7.3 වගන්ති | හදිසි රාජකාරි සම්බන්ධයෙන් සෙනසුරාදා, ඉරිදා හෝ රජයේ නිවාඩු දිනයක වැඩ කිරීමට නියම කරනු ලබන මාණ්ඩලික නිළධාරියෙකු එසේ වැඩ කළ එකිනෙක දිනය වෙනුවෙන් ඒකාබද්ධ මාසික වැටුපෙන් 1/20 ක සමාන මුදලක් ලබා ගැනීම සඳහා දිනකට පැය 08 කට නොඅඩු කාලයක් සේවය කළයුතු වුවත් මෙම දීමනාව ලබාගෙන තිබුණු සමාගමේ සියලුම නිළධාරීන් පැය 08ක සේවා කාලයක් සේවයේ යෙදී නොසිට රු. 1,615,088 ක නිවාඩු දින දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළදී ලබාගෙන තිබුණි. ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් ලබාගත් දත්ත අනුව ඇතැම් නිළධාරීන් අදාළ නිවාඩු දින සේවයට වාර්තා කර නොතිබුණද, එම දිනයන් සඳහාද මෙම දීමනාව ලබාගෙන තිබුණි. තවද, එක් කාර්යයක් වෙනුවෙන් අදාළ කරගත යුත්තේ එක් දීමනාවක්/ වරප්‍රසාදයක් පමණක් වුවද මෙම දීමනාවට අමතරව වැඩ කරන මෙම එක් එක් නිවාඩු දිනයක් වෙනුවෙන් හිලව් නිවාඩු දිනයක් හෝ හිලව් නිවාඩු දින දීමනාවක් සමාගම ලබාදී තිබුණු අතර ඒ සඳහා රු.477,019 ක් ගෙවීම් කර තිබුණි. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම සමාගම් පනත යටතේ සංස්ථාපනය කළ සමාගමක් හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ අධීක්ෂණය වන රාජ්‍ය ව්‍යාපාරයක් බැවින් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අදාළ නොවන බව, ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම වෙනුවෙන් සේවකයන් හා කළමනාකරුවන් සේවයේ නිරත කිරීමේදී අදාළ කරගනුයේ 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත සහ ඒ මත පදනම් වූ කම්කරු කොමසාරිස් විසින් අත්සන් කර ඇති 131 වැනි අධිකාරිය වන 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 12(1) වගන්තිය යටතේ ආරවුල් බේරුම් කිරීමේ කොන්දේසි පත්‍රය බව, එහි 24 වන වගන්තිය අනුව "ආයතනය තුළ සේවය නොකරන ලද දිනයන් සඳහා මෙතෙක් අනුගමනය කළ ක්‍රමවේදය අනුගමනය කරමින් කටයුතු කිරීමට නව සමාගම එකඟ වේ." ලෙස දක්වා ඇති බව, ඒ අනුව ආයතනයේ සේවය නොකරන ලද දිනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමට මේ අනුව බලය හිමි වී ඇති බව, ඒ අනුව ඉහත ආරවුල් බේරුම් කිරීමේ කොන්දේසි පත්‍රයේ එකඟතාවයන්ට අදාළව සී.ටී.සී. සර්විසස් සමාගම හා පසුව ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ කළමනාකාරීත්වය විසින් ආයතනය තුළ සේවය නොකරන ලද දිනයන් යටතේ අතිකාල හා නිවාඩු දින දීමනා සඳහා පෙර පැවති ක්‍රමවේදය අනුව කටයුතු කිරීමට එකඟතාවය පල කර ඇති බව. | ආයතන සංග්‍රහයේ නියමයන් අනුව කටයුතු කළ යුතු අතර ඉන් බැහැරව කටයුතු කිරීම සඳහා ඊට අදාළ ආයතන වලින් විධිමත් අනුමැතින් ලබාගත යුතුය. |

(ආ) 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහය හා මෙහෙයුම් අත්පොත

| | | | |
|---|---|---|---|
| i. මෙහෙයුම් අත්පොතේ 3.2(v) ඡේදය | දිරිදීමනා ගෙවීමේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය රහිතව සුපෝෂ අලෙවියෙන් ඉලක්කගත දීමනාවක් ලෙස සමාගමේ සියළුම සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 12,687,147ක දිරිදීමනා මුදලක් ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් සකස් කරන ලද පරිපාලන රීති සංග්‍රහය, අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත මීට ඉහතදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇති බව, 2023 වර්ෂයේදී සමාගමේ සමස්ථ අංශ ආවරණය වන පරිදි සකස් කරනු ලැබූ මෙහෙයුම් අත්පොත ද අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බව, | පරිපාලන රීති සංග්‍රහය හා මෙහෙයුම් අත්පොත සඳහා මෙතෙක් අනුමැතිය ලබාගෙන නොමැති බැවින් මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| ii. මෙහෙයුම් අත්පොතේ 3.3 ඡේදය | එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය හා සංවිධාන සටහන ඇතුළත් උපායමාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතු වුවත්, සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය සහ සංවිධාන සටහන ඇතුළත් උපාය මාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| iii. මෙහෙයුම් අත්පොතේ 3.6 ඡේදය | සමාගම විසින් උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලසුම් මත පදනම්ව ඵලදායී කාර්යසාධන ඇගයුම් පද්ධතියක් හඳුන්වා දිය යුතු අතර, එක් එක් සේවකයාගේ ඵලදායීතාවය ආසන්න නිළධාරියා විසින් ඇගයීමට ලක්කළ යුතු වුවද, තෘතික මට්ටම සහ ජොෂ්ඨ මට්ටමේ නිළධාරීන් සඳහා ඵලදායී කාර්යසාධන ඇගයුමක් සිදුකර නොතිබුණු බැව් අනාවරණය විය. | සමාගමේ එක් එක් සේවකයාගේ ඵලදායිතාව ආසන්නතම නිලධාරියා විසින් ඇගයීමට ලක් කර ඇති බව. | මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මෙම චක්‍රලේඛය සමාගමේ සේවකයින් සඳහා අදාළ කර ගත නොහැකි වුවද සමාගමේ සේවකයින් හට මෙම චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ රු5,339,402 ක් ආපදා ණය ලෙස ගෙවා තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් හා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සභාපති හා නිලධාරීන් අතර හමුවීමක් 2023.06.21 දින පැවැත්වූ බව, එහිදී ඇති කරගත් එකඟතා මත අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතීන් මත සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම සහ අනෙකුත් දීමනා පිළිබඳව සමාගමේ මෙහෙයුම් අත්පොතට ඇතුළත් කර ඒ සඳහාද අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බව. | විධිමත් ණය යෝජනා ක්‍රමයක් සකස් කර ඒ සඳහා විධිමත් අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ) | 2018 ජුලි 18 දිනැති අංක 03/2018 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ ii ඡේදය | වැටුප් හා දීමනා පිළිබඳ තීරණය කිරීමේ බලය අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ලබාදී නොමැති අතර අමතර ගෙවීම් ලෙස සිදුකරනු ලබන සියළු දීමනා සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, සමාගම විසින් 2017 වර්ෂයේදී හඳුන්වා දෙන ලද සුපෝෂ නිෂ්පාදනය සඳහා බඳවාගෙන තිබුණු අලෙවි කළමනාකරු හට රු.10,000 ක අමතර දීමනාවක් සුපෝෂ ගිණුමෙන් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් මත ගෙවා තිබුණු අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදි රු.120,000 ක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ගෙවා තිබුණි. | -එම- | මේ සඳහා අවශ්‍ය විධිමත් අනුමැතීන් ලබාගත යුතුය. |
| (ඉ) | අංක DMS/E4/13/08/413/1 සහ 2013 මාර්තු 28 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 | සමාගම සඳහා අනුමත කර තිබුණු බඳවා ගැනීමේ පටිපාටි අනුව සියලුම සේවා ශ්‍රේණියන් සඳහා තනතුරෙහි ස්ථිර කිරීම, ශ්‍රේණි අතර උසස්වීම සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම රජයට පවරා ගැනීමේදී කම්කරු කොමසාරිස්තුමා සමඟ ත්‍රිපාර්ශවීය ගිවිසුමක් ඇති කර ගන්නා ලද බව, එම ගිවිසුමට අදාළව සේවකයින් බඳවා | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සහ අදාළ අවස්ථාවේ දී අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගැනීම සම්බන්ධයෙන් සමාගම කටයුතු කර නොතිබුණි. ඒ අනුව අදාළ පත්වීම් ස්ථිර කිරීම හා උසස් කිරීම් උක්ත සඳහන් පූර්ව අවශ්‍යතා කොන්දේසි ඉටුවීමකින් තොරව සිදු කර තිබුණි. | ගැනීමේ ක්‍රමවේදයක් නොතිබුණු බව, ඊට අමතරව මෙම ආයතනයේ විභාග අංශයක් නොමැති බව, උසස් වීම් හා කාර්යක්ෂමතා කඩඉම් හා අදාළ මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවනතාවයන් සටහන් කර තිබුණද ඊට අදාළ ක්‍රමවේදයක් නොමැති බැවින් මේ වන විට ඊට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | |
| (ඊ) | 2022 ජනවාරි 18 දිනැති අංක 02/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | දුරකතන දීමනා සඳහා හිමිකම් නොලබන සමාගමේ (JM 1-1) තෘතියික මට්ටමේ නිලධාරින් හට රු.1,000 ක දුරකතන දීමනාවක් 2019 මාර්තු 14 දින සිටද, MA 1-1 සහ MA 2-1 තනතුරුවල සේවය කරන නිලධාරින් 07 දෙනෙකු සඳහා 2019 ජූලි 15 දින සිටද ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත රු.1,000 ක මාසික දුරකතන දීමනාවක් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ගෙවා තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් හා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සභාපති හා නිලධාරීන් අතර 2023.06.21 දින පැවැත්වූ රැස්වීමේදී ඇති කරගත් එකඟතා මත අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතීන් මත සමාගම මගින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම සහ අනෙකුත් දීමනා පිළිබඳව සමාගමේ මෙහෙයුම් අත්පොතට ඇතුළත් කර ඒ සඳහාද අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2022 ජනවාරි 14 දිනැති අංක 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉන්ධන දීමනාව ලබාදිය නොහැකි MM වැටුප් තලයේ නිලධාරින් 05 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදි රු.1,200,000 ක් ගෙවා තිබුණි. | -එම- | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2016 ඔක්තෝබර් 21 දිනැති අංක 2016/02(I) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය | සමාගමේ HM1-1 සේවා ශ්‍රේණිය දරන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරීන් දෙදෙනෙකු සඳහා අනුමැතියකින් තොරව 2020 වර්ෂයේ සිට HM1-2 සේවා ශ්‍රේණිය යටතේ වැටුප් වර්ධක ලබාදී තිබුණි. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 ප්‍රකාරව HM 1-1 සේවා ශ්‍රේණිය සඳහා වැටුප් වර්ධක ලබා දීම සිදු කර ඇති බව, විගණන නිර්දේශය ප්‍රකාරව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016(I) අනුව ඉදිරියේදී HM සනයේ වැටුප් වර්ධක ලබා දීම සිදු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 555,406,517 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු. 48,310,073 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.603,716,590 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයට අයත් ත්‍රිපෝෂ ආපසු හරවා එවුම් වෙනුවෙන් වූ රු. 11,701,601 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු බැව් හඳුනා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදීද අදාළ මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් රු.204,065,974 ක් වටිනාකමෙන් යුතු ලැබිය යුතු බිල්පත් 2023/12/31 දිනට පැවති බව, රු.11,701,601 ක වටිනාකමෙන් යුතු ගෙවිය යුතු ශේෂ මෙම වර්ෂයේදී නිරාකරණය කිරීමට කටයුතු කරන බව. | මෙම මුදල් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලියට අනුව ශ්‍රී ලංකාවේ මාතෘ හා ළදරු මන්දපෝෂණය අවම කරනු පිනිස ශ්‍රී ලංකාව විසින් බලගන්වනු ලබන අතිරේක ආහාර නිෂ්පාදනයන් සඳහා පහසුකම් සැලසීම හා වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය තක්සේරු කර ඒවා සැපයීමට අවශ්‍ය කටයුතු කිරීම සිදුකළ යුතු වේ. මෙම අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා පවුල් සෞඛ්‍ය කාර්යාංශය මගින් ලබාදෙන දත්ත මත පදනම්ව වාර්ෂික ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වාර්ෂික නිෂ්පාදන සැලැස්මක් සකස් කළද එය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර අනුමත කරවාගෙන නොතිබුණි. කෙසේ වුවත් සකස් කරන ලද නිෂ්පාදන සැලැස්ම අනුව වාර්ෂික ප්‍රතිලාභීන් 795,036 ක් සඳහා ත්‍රිපෝෂ සැපයීම වෙනුවෙන් නඩත්තු හා නිවාඩු දින හැර දින 282 කදී නිෂ්පාදන කටයුතු ඉටු කිරීම සඳහා සැලසුම් සකස් කළද වර්ෂය තුළ සත්‍ය වශයෙන් නිෂ්පාදන කටයුතු කළ දින ගණන 211 ක් විය. ඒ අනුව මාසික ත්‍රිපෝෂ අවශ්‍යතාවයට අදාළව නිෂ්පාදන කටයුතු සම්පූර්ණයෙන් සිදු | වාර්ෂික නිෂ්පාදන සැලැස්ම සකස් කෙරෙනුයේ ත්‍රිපෝෂ ප්‍රතිලාභී දත්ත පදනම් කරගෙන බව, නිෂ්පාදන සැලැස්ම අනුව සකස් කරනු ලබන වාර්ෂික අයවැය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සෞඛ්‍ය අමාත්‍යාංශය / රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන බැවින් නිෂ්පාදන සැලැස්ම සඳහා වෙනමම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා නොගන්නා ලද බව, නමුත් ඉදිරි වර්ෂයේ සිට නිෂ්පාදන සැලැස්ම සඳහාද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව, නිෂ්පාදන අංශය විසින් පිළියෙළ කරනු ලබන වාර්ෂික නිෂ්පාදන සැලැස්ම සලකා බලනු ලබන මාසයන්ට අදාළව අමුද්‍රව්‍ය ලැබීම් පුරෝකථන මත මාසිකව සංශෝදනය වන බව, 2023 වර්ෂයේදී පෙබරවාරි අවසන් සතියේ ලෝක අහාර සංවිධානයේ අමුද්‍රව්‍ය ලැබීම් හා දේශීය අමුද්‍රව්‍ය මිල දී ගැනීම තොග අවසන් වීමත් අදාළ පිරිවිතරයන්ට අනුකූලව අමුද්‍රව්‍ය නොලැබීම් මතද නිෂ්පාදන කටයුතු සඳහා අමුද්‍රව්‍ය යොදා ගැනීමට නොහැකි වූ බව, තවද වාර්ෂික නිෂ්පාදන සැලැස්ම අනුව නිෂ්පාදනය කළ යුතු ත්‍රිපෝෂ මාස්ටර් බෑග් | ත්‍රිපෝෂ නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු අතර ප්‍රමිතියෙන් යුතු බඩඉරිඟු තොග ලබාගැනීම සඳහා වැඩපිළිවෙලක් කෘෂිකර්ම අමාත්‍යාංශය හා සෞඛ්‍ය අමාත්‍යාංශය එක්ව සකස් කර නිෂ්පාදනය වර්ධනය කර ගනිමින් යන්ත්‍ර ඌන උපයෝජනය වීම වලක්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කර තිබුණු මාස ගණන 03ක් පමණක් විය. එසේම සමාගම පිළියෙල කරන ලද නිෂ්පාදන සැලසුම අනුව සුපෝෂ නිෂ්පාදනය හා කැලරි බිස්කට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය සඳහන් කර නොතිබුණු බැවින් එම නිෂ්පාදන අවශ්‍යතා වෙනුවෙන් වූ අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණය හඳුනාගත නොහැකි විය. ඒ අනුව ත්‍රිපෝෂ අවශ්‍යතාවයට ඇස්තමේන්තු කරන ලද අමුද්‍රව්‍ය සුපෝෂ හා කැලරි බිස්කට් වෙනුවෙන් යොදවා ගැනීම තුළින් සමාගමෙහි අපේක්ෂිත වූ අරමුණ ඉටුවී නොතිබුණි. | ප්‍රමාණයද, පෝෂණ අංශය හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල් කාර්යාල මගින් ලබා දෙන දත්ත මත මාසිකව සංශෝදනය වන බව, සමාගම විසින් පිළයෙල කරනු ලබන නිෂ්පාදන සැලැස්ම තුළ ත්‍රිපෝෂ සහ සුපෝෂ නිෂ්පාදිත සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ප්‍රමාණයන් සඳහන් වන බව, 2024 වර්ෂයේ සිට සුපෝෂ කැලරි බාර් සඳහාද නිෂ්පාදන සැලැස්මක් අදාළ අලෙවි අංශ පුරෝකථන මත සකස් කරන බව. | |
| (ඇ) | 2023 වර්ෂය තුළ සමාගම විසින් නිෂ්පාදනය කරන ලද සම්පූර්ණ නිමිද්‍රව්‍ය ප්‍රමාණය කිලෝග්‍රෑම් 9,163,067 ක් වූ අතර ඉන් සියයට 80 ක් හෙවත් කිලෝග්‍රෑම් 7,341,728 ක් පමණක් ත්‍රිපෝෂ නිෂ්පාදනය කර තිබුණු අතර ඉතිරි සියයට 20 ක් හෙවත් කිලෝග්‍රෑම් 1,821,339 ක් සුපෝෂ නිෂ්පාදනය කර තිබුණි. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සමාගම වෙත පවරා ඇති ප්‍රමුඛ කාර්යය වූ ත්‍රිපෝෂ නිෂ්පාදන ඉලක්කය සියය 62 ක් වැනි මට්ටමකින් සපුරා තිබියදී සමස්ථ නිෂ්පාදනයෙන් සියයට 20 ක් සුපෝෂ නිෂ්පාදනය කිරීම ආයතනය පිහිටුවීමේ මූලික අරමුණට අනුකූල නොවීමක් බව අනාවරණය විය. | වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සපුරා ගැනීමට ප්‍රමාණවත් අමුද්‍රව්‍ය ප්‍රමාණයක් වාර්ෂික අමුද්‍රව්‍ය ලැබීම් මත සපුරා ගත හැකි වුවද,එම ලැබීම් මාසිකව ක්‍රමානුකූලව සිදු නොවීම මත සැලසුම් ගත ඉලක්ක ලගා කර ගැනීමට අපහසු වූ බව, 2023 වර්ෂයේ මාර්තු මස ලෝක ආහාර සංවිධානය විසින් ලද ප්‍රදාන අවසන් වීමත් සමඟ ලද අමුද්‍රව්‍යවල පිරිවිතරයන්ට අනුකූලව සහ සමාගමේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා සහ වෙළඳපොල වෙත අලෙවි නියෝජිත ජාලය හරහා සුපෝෂ ලබා දීමද සිදුකළ යුතු හෙයින් ත්‍රිපෝෂ නිෂ්පාදනයට අමතරව සුපෝෂ නිෂ්පාදනයද අවම මට්ටමකින් සිදු කිරීමට සිදු වූ බව. | වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. |
| (ඈ) | සමාගම පිහිටුවීමේ ප්‍රධාන පරමාර්ථය වූ, ත්‍රිපෝෂ නිෂ්පාදනය කිරීමට වඩා සුපෝෂ නිෂ්පාදනය කිරීම කෙරෙහි සමාගම වැඩි පෙළඹවීමක් ඇති බවත් මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ සුපෝෂ නිෂ්පාදන අලෙවි ආදායම මත පදනම්ව ලාභයෙන් සියයට 5 සිට සියයට 10 දක්වා ඉලක්ක දීමනාවක් ගෙවීමට සමාගම කටයුතු කිරීම බව අනාවරණය විය. එසේම ඉලක්ක දීමනා සඳහා නිසි අනුමැතියක් හා ක්‍රමවේදයක් නොතිබුණි. | සමස්ත නිෂ්පාදන ඉලක්ක මත ඉලක්කගත දීමනා ගෙවීම් ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය වෙත යොමු කොට එම අනුමැතිය ප්‍රකාරව සමාගමේ මෙහෙයුම් අත්පොතට ඇතුළත් කොට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇති බව. | වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු අතර නිෂ්පාදන ඉලක්ක දීමනාව විධිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා නිෂ්පාදනය වෙනුවෙන් අවශ්‍යවන සැලසුම්ගත අමුද්‍රව්‍ය වන බඩඉරිඟු, සෝයා, කිරි පිටි, විටමින් හා මිනරල් නිෂ්පාදනය සඳහා යොදාගත හැකි ප්‍රමාණය පිළිවෙලින් මෙ.ටොන් 8927ක් 3862ක් 304 ක් 09 ක් හා 90 ක් වශයෙන් වූ අතර සත්‍ය වශයෙන් වර්ෂය තුළ නිෂ්පාදනය වෙනුවෙන් නිකුත් කළ අමුද්‍රව්‍ය ප්‍රමාණය පිළිවෙලින් මෙ.ටොන් 7,179ක් 2,432ක් ,284 ක් 08 ක් හා 84 ක් විය. ඒ අනුව වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සපුරා ගැනීමට ප්‍රමාණවත් අමුද්‍රව්‍ය ප්‍රමාණයක් පරිත්‍යාග හා මිල දී ගැනීම් මඟින් ලැබී තිබුණ ද එම අවශ්‍යතාවය ඉටු කිරීමට කටයුතු කර නොතිබුණු අතර සුපෝෂ මෙ.ටොන් 1,822ක් නිෂ්පාදනය සඳහා මෙම අමුද්‍රව්‍ය අන්තර්ගතය යොදා ගැනීම මීට හේතුවී තිබුණු බවද අනාවරණය විය. | 2023 වර්ෂයේදී පෙබරවාරි අවසන් සතියේ ලෝක අහාර සංවිධානයේ අමුද්‍රව්‍ය ලැබීම් හා දේශීය අමුද්‍රව්‍ය මිල දී ගැනීම තොග අවසන් වීමත් අදාළ පිරිවිතරයන්ට අනුකූලව අමුද්‍රව්‍ය නොලැබීම් මතද නිෂ්පාදන කටයුතු සඳහා අමුද්‍රව්‍ය යොදා ගැනීමට නොහැකි වූ බව, අමුද්‍රව්‍ය ලැබීම් ක්‍රමනුකූල වීම මත ජුනි මස සිට නිෂ්පාදන කටයුතු සිදු කිරීමට හැකි වූ බව, වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සපුරා ගැනීමට ප්‍රමාණවත් අමුද්‍රව්‍ය ප්‍රමාණයක් වාර්ෂික අමුද්‍රව්‍ය ලැබීම් මත සපුරා ගත හැකි වුවද,එම ලැබීම් මාසිකව ක්‍රමානුකූලව සිදු නොවීම මත සැලසුම් ගත ඉලක්ක ලගා කර ගැනීමට අපහසු වූ බව, 2023 වර්ෂයේ මාර්තු මස ලෝක ආහාර සංවිධානය විසින් ලද ප්‍රදාන අවසන් වීමත් සමග ලද අමුද්‍රව්‍යවල පිරිවිතරයන්ට අනුකූලව සහ සමාගමේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා මාර්තු මාසය තුළ සුපෝෂ නිෂ්පාදනය සාපේක්ෂව වැඩි කිරීමට සිදු විය. | වාර්ෂික ත්‍රිපෝෂ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. |
| (ඊ) | යෝජිත සයිලෝ පද්ධතිය ඉදිකිරීම වෙනුවෙන් රු.192,091,525 ක් ලෝක ආහාර වැඩසටහන (WFP) මගින් 2021 වර්ෂය තුළදී ලබාදී තිබුණු අතර, එම මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. 2023 ජනවාරි 02 දින වන විට එහි කල්පිරුණු අගය වූ රු. 207,815,400 ක මුදල ජනවාරි 20 දින මුදල් කරගෙන තිබුණු අතර මින් රු.125,000,000 ක මුදලක් 2023 ජනවාරි 27 දින නැවත ආයෝජනය කර තිබුණි. කෙසේ වුවත්, මෙම අරමුදල් සැපයූ අරමුණ ඉටු නොකර වෙනත් කාර්යයක් සඳහා මෙම අරමුදල් වැයකර තිබුණු බව නිරීක්ෂණය විය. එසේම මෙම මුදල සඳහා දින 18 ක කාලයක් සඳහා කිසිදු පොලී මුදලක් ලැබී නොතිබුණු අතර නැවත ආයෝජනය සඳහා තවත් දින 07 ක් ගතකර තිබුණි. | අදාළ ස්ථාවර තැන්පතුව මුදල් කර ගැනීම සඳහා 08/2022 දරන අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකාවෙන් අනුමැතිය හිමි වී තිබුණු බව, අත්‍යවශය ප්‍රාග්ධන වියදම් හා ත්‍රිපෝෂ නිෂ්පාදනය වෙනුවෙන් ලැබිය යුතු බිල්පත් පැවතීමෙන් ස්ථාවර තැන්පතුව පරිනත වීමට පෙර මුදල් කර ගැනිමට නිර්දේශ ලබා දුන්නද 2023/01/02 වන තෙක් (පරිනත දිනය) සමාගම එය කළමනාකරණය කරන ලද බව, 2022/10/20 දින අනුමත කරන ලද 08/2022 දරන අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකාව අනුව 2023/01/20 දින ස්ථාවර තැන්පතුව මුදල් කොට ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා අවශ්‍ය රදවා ගැනීම් ජංගම ගිණුමේ රඳවා ගෙන 2023/01/26 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට 02/2023 දරන අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකාවෙන් රු. මිලියන 125 ක් නැවත ස්ථාවර තැන්පතු ආයෝජනය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලද බව, ඉන් පසු දින 2023/01/27 දින ස්ථාවර තැන්පතුව විවෘත කරන ලද | මෙම මුදල අපේක්ෂිත අරමුණ සඳහා වැයකළ යුතු අතර ආයෝජන තීරණ ගැනීමේදී ආයතනයට උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි තීරණ ගත යුතුය. |

| | | |
|---|---|---|
| | | බව, 2024 වර්ෂයේදී සයිලෝ ව්‍යාපෘතිය ඇතුළු ඉදිරි ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාරව රු.මිලියන 100 ආයෝජනයක් සිදු කිරීමට කටයුතු කරන බව. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ත්‍රිපෝෂ සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය 07 දෙනෙකුගෙන් සමන්විත වන අතර එය අදාළ අංශ නියෝජනය වන පරිදි පත්කර ඇති බව නිරීක්ෂණය විය. එසේ වුවද සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝජනය කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කර තිබුණද 2022 වර්ෂයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 න් රැස්වීම් 8 කට ඔහු සහභාගි වී නොමැති බව නිරීක්ෂණය වූ අතර 2023 වර්ෂයේ පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10න් කිසිදු රැස්වීමකට ඔහු සහභාගි වී නොමැති බවද අනාවරණය විය. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් නියෝජිතයා ලෙස පත් කර ඇති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වීමට කැඳවීම් ලිපි ඉදිරිපත් කර ඇති බව, නමුත් ඔහුගේ සහභාගීත්වය නොමැති වීම හමුවේ 2023.10.02 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම යන මැයෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිපියක් යොමු කොට ඇති බව. | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ සහභාගිත්වය වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් රු.මිලියන 3,555.6ක් වූ අමුද්‍රව්‍ය පිරිවැය, රු.මිලියන 602.3ක් වූ සෘජු පිරිවැය හා රු.මිලියන 50.7ක් වූ වැටුප් ඇතුළු පරිපාලන වියදම් ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදන ප්‍රතිශතය මත (සියයට 80 හා සියයට 20) බෙදාහැර තිබුණ අතර විකුණුම් හා බෙදාහැරීමේ වියදම් ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදන අතර සියයට 49 හා 51 අනුපාතයටද,පරිපාලන වියදම් සියයට 92 හා 8 අනුපාතයටද,මූල්‍ය වියදම් සියයට 65 හා 35 අනුපාතයටද පිළිගත හැකි ක්‍රමවේදයකින් තොරව | ත්‍රිපෝෂ සහ සුපෝෂ නිෂ්පාදනය සමග නිශ්චිතව හඳුනා ගත හැකි වියදම් වෙන්ව හඳුනා ගෙන අනෙකුත් සියලුම වියදම් ත්‍රිපෝෂ සහ සුපෝෂ නිෂ්පාදන ප්‍රතිශතය මත බෙදා හැර ඇති බව. | ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදනය සමඟ නිශ්චිතව හඳුනාගත හැකි වියදම් හා ආදායම් ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදනයට අදාළව වෙන්වෙන්ව හඳුනාගත යුතු අතර එසේ නිශ්චිතව හඳුනාගත නොහැකි සියළුම වියදම් හා ආදායම් ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදන ප්‍රතිශතය මත බෙදාහැර ත්‍රිපෝෂ හා සුපෝෂ නිෂ්පාදනය සම්බන්ධ ලාභ පාඩු තීරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බෙදා හැර තිබීම හේතුවෙන් ත්‍රිපෝෂ නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා අනුගමනය කර තිබූ ක්‍රමය තුලින් ත්‍රිපෝෂ නිෂ්පාදන පිරිවැයෙහි නිවැරදිතාවය ගණනයේදී තහවුරු නොවීය. | | |
| (ආ) | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් අනුව තැන්පතු පොළී ආදායම හා අපතය විකිණීමෙන් ලබන ආදායම පදනම් කර ගෙන සමාගමේ සේවකයින් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. 15,390,730 ක දිරිදීමනාවක් ගෙවා තිබුණු අතර ත්‍රිපෝෂ නිෂ්පාදන ක්‍රියාවලියේදී ඇතිවන බැහැරවීම් මෙලෙස අපතය ලෙස විකුණන අතර, එම ලැබෙන මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත බැර කළ යුතු වුවත් මෙම දිරි දීමනාව ගෙවීම සඳහා භාවිතා කර තිබුණි. එසේම දිරිදීමනා ගෙවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. පැමිණීම හා කාර්යසාධනය මත ලබාදෙන දීමනාවක් ලෙස මෙම දිරිදීමනාව නම් කළද පැමිණීම සම්බන්ධයෙන් පමණක් සලකා තිබුණු අතර, කාර්යසාධනය ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි. තවද, සමාගමේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිළධාරීන්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධයෙන් සමාගමේ පවතින නීති, රීති අනුගමනය කර නොතිබුණු බැවින් පැමිණීම පදනම් කරගෙන සිදුකරන මෙම ගෙවීම්වල වලංගුතාවය සම්බන්ධයෙන් ගැටලු සහගත විය. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම විසින් සකස් කරන ලද පරිපාලන රීති සංග්‍රහය, අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත මීට ඉහතදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇති බව, 2023 වර්ෂයේදී සමාගමේ සමස්ථ අංශ ආවරණය වන පරිදි සකස් කරනු ලැබූ මෙහෙයුම් අත්පොත ද අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද බව, මෙය අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ප්‍රකාරව වාර්ෂිකව ලබා දෙනු ලබන දීමනාවක් බව, එය ලබා දීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකගතාවය PE/COM/SLTL/EST හා 28/11/2012 දිනැති ලිපිය ප්‍රකාරව එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශ කර ඇති බව, තවද PED 04/2023 දරන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාරයන්හි සේවකයන් හට ආයතනයේ ලාභය මත ප්‍රසාද දීමනා ගෙවීම් කිරීම සඳහා මාර්ගෝපදේශයක් ලබා දී ඇති බව, එයට අනුව පැමිණීම /කාර්යසාධනය මත දිරිදීමනා ලබා දීමෙන් පසුව වුවද පෙර වර්ෂයේ ලාභය මත ප්‍රසාද දීමනා ලබා දිය යුතු ආකාරය පිළිබඳව සඳහන් කර ඇති බව, 2022 මුල්‍ය වර්ෂයේදී තොග හානි සිදු වීමෙන් සමාගම අලාභයක් වාර්තා කළ හෙයින් ප්‍රසාද දීමනා ගෙවීමක් සිදු නොකරන ලද බව, ඊට අමතරව PED 08/2022 චක්‍රලේඛය ප්‍රකාරව ඉතිරි කර ගත නිවාඩු මත දීමනා ගෙවීමට අනුමැතිය ලැබී ඇති බව. | විධිමත් ක්‍රමවේදයක් සකස් කර ඒ සඳහා විධිමත් අනුමැතින් ලබාගත යුතුය. |
| (ඇ) | සේවක දිරිගැන්වීමක් වශයෙන් හා අනුමත කළ/නොකළ වැටුප් රහිත නිවාඩු ලබා නොගත් සේවකයින් 162 කට සමාගමේ සභාපතිවරයාගේ අනුමැතිය මත සමාලෝචිත වර්ෂයේදී වැටුප් වර්ධක දෙක බැගින් | 2021 /2022 /2023 වර්ෂයන්හි පැවති අර්බුධකාරී වාතාවරණ හමුවේ ත්‍රිපෝෂ සමාගමේ නිෂ්පාදන කටයුතු ඉහල නැංවීමට කරන ලද කැපවීම මත 2023 වර්ෂයේදී වැටුප් වර්ධක දෙකක් ආයතන ප්‍රධානියාගේ අනුමැතිය මත ලබා දෙන ලද බව, 2023 | මේ සඳහා විධිමත් ක්‍රමවේද සකස්කර අවශ්‍ය විධිමත් අනුමැතින් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවා තිබුණි. ඒ අනුව මාසිකව රු.67,690 ක මුදලක් වැටුප් වර්ධක ලෙස වැඩිපුර ගෙවා තිබුණි. මෙම පූර්වාදර්ශය 2024 වැටුප් වර්ධක ලබාදීමේදීද අනුගමනය කරමින් මෙලෙස වැටුප් වර්ධක දෙක බැගින් ගෙවා තිබුණි. | මූල්‍ය වර්ෂයේ සමාගම විසින් ළගා කර ගත් මූල්‍ය (බදු පෙර ලාභය) හා නිෂ්පාදන කාර්යසාධනය මත 2024 වර්ෂය සඳහා වැටුප් වර්ධක දෙක බැගින් ගෙවීමට සමාගමේ ආයතන ප්‍රධානියා වන සභාපති විසින් අනුමැතිය ලබා දෙන ලද බව. | |
| (ඇ) | සමාගම විසින් 2016 වර්ෂයේදී පරිපාලන රීති සංග්‍රහය සකස්කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය මෙතෙක් ලැබී නොතිබුණි. කෙසේ වුවත් සමාගම විසින් එහි අඩංගු ඇතැම් අනුමත නොවූ නිතී,රීති අනුගමනය කර තිබුණි. | පරිපාලන රීති සංග්‍රහය ඇතුළුව සමාගමේ සියලුම අංශ ආවරණය වන මෙහෙයුම් අත් පොත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත 2023 දෙසැම්බර් මස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාරව යොමු කරන ලද බව, ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය කටයුතු සිදු කරන බවත් ඊට මාස කිහිපයක කාලයක් ගත වන බවත් එම දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් දන්වන ලද බව. | අදාළ විධිමත් අනුමැතිය ලැබෙන තුරු මෙහෙයුම් අත් පොතෙහි දැක්වෙන කරුණු ක්‍රියාත්මක නොකළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අංක DMS/E4/13/08/413/1 දරන 2013 මාර්තු 28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ ලිපිය ප්‍රකාරව සමාගම වෙනුවෙන් 2010 දෙසැම්බර් 02 දින අනුමත කළ සියලු තනතුරු සඳහා අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ විධිවිධාන පරිදි සකස් කරන ලද, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව විසින් නිර්දේශිත බඳවාගැනීම් පටිපාටිය අනුමත කර තිබුණ ද එදිනෙන් පසුව ඇති කරන ලද නව තනතුරු තුනක් සඳහා බඳවා ගැනීම් පටිපාටි සකස් කර අනුමත කරවාගෙන නොතිබුණි. එමෙන්ම අනුමත බඳවාගැනීම් පටිපාටියකින් තොරව ඇතැම් බඳවාගැනීම් ද සිදු කර තිබුණු බව අනාවරණය විය. | ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමේ සේවා අවශ්‍යතාවය පදනම් කරගෙන නව අත්‍යවශ්‍ය තනතුරු කිහිපයක් අලුතින් කාර්යමණ්ඩලයට ඇතුළත් කිරීමේ හා පවත්නා තනතුරු සංඛ්‍යාවේ සංශෝධන කිහිපයක් ඇති කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන ඇති බව, තවද විගණනය විසින් පෙන්වා දී ඇති බඳවා ගැනීම් සඳහා වැටුප් මට්ටම පදනම් කරගෙන SOR යාවත්කාලීන සිදු නොකර අදාළ තනතුරු නාමයට තනතුරු ප්‍රමාණය පමණක් වැඩි කරවාගෙන ඇති බව, ඉදිරියේදී මෙම තනතුරු වලටද බඳවා ගැනීමේ පටිපාටි (SOR) අනුමත කර ගැනීමට කටයුතු කරන බව. | සෑම තනතුරකටම අදාළ බඳවා ගැනීමේ පටිපාටි සකස් කර අනුමත කරවා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ද්විතීය මට්ටම යටතේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරෙහි අනුමත නිළධාරීන් සංඛ්‍යාව 16 ක් වුවත් තථ්‍ය සේවත සංඛ්‍යාව 08 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 08 ක් විය. එසේම තෘතීක මට්ටමේ තනතුරක් වූ මුදල් නිළධාරී තනතුර 2021 අගෝස්තු 01 පුරප්පාඩු වී තිබුණි. මෙම පුප්පාඩු පිරවීමට හෝ එම තනතුරු තවදුරටත් අවශ්‍ය නොවන්නේ නම් තනතුරු අවලංගු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | පැවති මුදල් නිලධාරී තනතුරෙහි පුරප්පාඩුව පුරවා ඇති බව, මෙය 2024 ජනවාරි මස සිට ක්‍රියාත්මක වී ඇති බව, ඊට අමතරව කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) පුරප්පාඩු සඳහා සේවා අවශ්‍යතාවය මත ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කරන බව. | පුප්පාඩු පිරවීමට හෝ එම තනතුරු තවදුරටත් අවශ්‍ය නොවන්නේ නම් තනතුරු අවලංගු කිරීමට හෝ කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී සිදු කරන ලද අභ්‍යන්තර විගණනයන්ට අදාළ වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කාලානුරූපීව පවත්වනු ලබන විගණන හා කළමනාකරණ රැස්වීම් වෙත අභ්‍යන්තර විගණන විමසුම් ඉදිරිපත් කරන බව. | වාර්ෂික අභ්‍යන්තර විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කළ යුතු අතර නිකුත් කරනු ලබන අභ්‍යන්තර විගණන විමසුම්වල හෝ වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (h) ඡේදය ප්‍රකාරව මාස 03 කට වරක්වත් විගණන කමිටුව රැස්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටු 03ක් පමණක් පවත්වා තිබුණි. | 2023 මූල්‍ය වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර තුනක් පවත්වා තිබුණු අතර මෙම වර්ෂයේ සිට අවම වශයෙන් රැස්වීම් වාර හතරක් පැවැත්වීම සඳහා කටයුතු කරන බව. | නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |